සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time :2hour**

## Buddhism– I

## බුද්ධ ධර්මය– I

Name :- .................................................. Grade : -................ Index number:-....................

❖ **සැලකිය යුතු යි.**

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය(I,II). I කොටසට ලකුණු 40කි. මුළු ලකුණු 100. I කොටසේ ප්‍රශ්න 20 ටම පිළිතුරු සපයන්න. (II) කොටසේ ප්‍රශ්නවලින්, පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයකට ලකුණු 20 කි. (II) කොටසට පිළිතුරු වෙනම කොළයක ලියා අමුණන්න.**

- **ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. දෙව්දත් තෙරුණ් සංඝභේදය ඇතිකිරීම සඳහා යොදාගත් උපාය කුමක් ද?
   (1) නාලාගිරි ඇතුට රා පොවා බුදුන් වහන්සේ ඉදිරියට යැවීම
   (2) ගිජ්ජකූට පර්වතයට නැඟී බුදුන් වහන්සේට ගලක් පෙරලීම
   (3) පංචවර යාචනය
   (4) දුනුවායන් යොදා ඊතල වලින් බුදුන් වහන්සේට විදීම

2. බුදුන් වහන්සේගේ ආචාරශීලී බව පිළිබඳව ප්‍රකාශයක් සිදුකළේ කවුද?
   (1) අනේපිඬු සිටුතුමා (2) සෝණ දණ්ඩ බමුණාය
   (3) විශාඛා උපාසිකාව (4) අසිත තවුසා ය

3. ඒහි සාගතවාදීය යන්නෙන් පැවසෙන්නේ, බුදුන් වහන්සේ තුළ පැවති කවර ගුණය ද?
   (1) ආගන්තුකයන් පිළිගැනීම (2) විවෘත කතාබහ
   (3) මහා කරුණාව (4) නොමඟ ගියවුන් සුමඟට ගැනීම

4. ධර්මය ස්වාක්ඛාත වන්නේ කුමක් හේතුවක් නිසා ද?
   (1) මෙලොවදීම දූන දූකගත හැකි බැවින්
   (2) ධර්මය මුල, මැද, අග යන තැන් තැන්හිම යහපත් බැවින්
   (3) ඒ මොහොතේම ප්‍රතිඵල ලැබෙන බැවින්
   (4) සැමට අවබෝධ කරගත හැකි බැවින්

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

5. තමන් වහන්සේගේ ඇවෑමෙන් ශාස්තෘවරයා බවට පත්වන්නේ කවුරුන් ද යන්නට උන්වහන්සේ දුන් පිළිතුර කුමක් ද?
   (1) ධර්මය (2) විනය (3) ධර්මය හා විනය (4) ජාතක පාළිය

6. ''පොක්ඛරසාතී'' නම් බමුණු පඬිවරයකු ඇසුරේ ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කොට ආපසු යන අතර අකල් මරණයකට මුහුණ දී බුදුගුණ ගාථාවක් සිහිපත් කරමින් ගිය නිසා දෙව්ලොව උපන් කවුරුන් ද?
   (1) මට්ටකුණ්ඩලී (2) ඡත්ත (3) පිලෝතික (4) සකුලුදායී

7. බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ නමින් හැඳින්වීමට හේතුව කුමක් ද?
   (1) උතුම් ඥාන අටකින් යුක්ත වීම
   (2) සියළු ලෝක වල සැබෑ තත්වය අවබෝධ කරගත් නිසා
   (3) චතුරාර්ය සත්‍යය ගුරු උපදේශයකින් තොරව තමාගේ නුවණින්ම අවබෝධ කරගත් නිසා
   (4) සුන්දර නිවනට පත් වූ නිසා

8. පසුව මුගලන් තෙරුණ් බවට පත් කෝලිත පිරිවැජියා සෝවාන් ඵලයට පත්වූයේ කුමන රහතන් වහන්සේ ගේ දේශනාව ඇසීමෙන් ද?
   (1) උපතිස්ස හිමි (2) අස්සජි හිමි (3) මහාකාශ්‍යප හිමි (4) උපාලි හිමි

9. සැරියුත් තෙරණුවෝ රහත්භාවයට පත්වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් ද?
   (1) අනන්ත ලක්ඛණ සූත්‍රය (2) වේදනා පරිග්‍රහ සූත්‍රය
   (3) දම්සක්පැවතුම් සූත්‍රය (4) වසල සූත්‍රය

10. යම් කෙනෙක් මුලදී පමා උවත් පසුව නුවණින් විමසා බලා නොපමාව කටයුතු කරයි. ඔහුට ලෝකය බැබළවිය හැකි බවට උපමා කොට දැක්වූයේ කවුරුන් ද?
   (1) සම්මුඤ්ජනී තෙරුන් (2) අජාසත් රජු
   (3) දේවදත්ත (4) ආලවක

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශය නිවැරදි නම් '' √ ''ලකුණ ද වැරදි නම් '' x'' ලකුණ ද යොදන්න.**

11. දෙව්දත් තෙරුණ්ගේ පංචවර යාචනය බුදුරජාණන් වහන්සේ විසින් තරයේ ප්‍රතික්ෂේප කරන ලදී. ( )
12. බුදුජාණන් වහන්සේ ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම මත භික්ෂූන් වහන්සේට අතිරේක ගෘහපති චීවරය පිළිගැනීමට අවසර දුන්නේ ය. ( )
13. මෙලොවදීම දැන, දැකගත හැකි බැවින් ධර්මය සන්දිට්ඨික වේ. ( )
14. අප විසින් නොකළ යුතු දෑ විරිත් නම් වේ. ( )
15. දෙවි, මිනිස් බඹ යන ලෝකවල සැබෑ තත්වය අවබෝධ කළ බැවින් බුදුරජාණන් වහන්සේ ''අරහං'' නම් වන සේක. ( )

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට "A" තීරුවට වඩාත් ගැලපෙන පිළිතුර "B" තීරුවෙන් තෝරා යා කරන්න.**

| **A තීරුව** | | **A තීරුව** |
|---|---|---|
| 16. | සුගත | මුල, මැද, අග, මනාව අවබෝධ කොට |
| 17. | සන්දිට්ඨිකෝ | දේශනා කළ |
| 18. | අනුත්තරෝ පුරිස ධම්ම සාරථී | සුන්දර නිවනට වැඩම කළ නිසා |
| 19. | තම ආචාර්යවරයාට ගරු කිරීම | මවු පියන් මැරීම නිසා සොරුන්ගෙන් |
| 20. | මුගලන් තෙරුණ් වහන්සේට | පහර කා මිය යාම |
| | | අංගුලිමාල මාල |
| | | සැරියුත් මහ තෙරුණ් වහන්සේ |

(මුළු ලකුණු 20 x 2 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – First Term Test –April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 8 ශ්‍රේණිය

## Buddhism – II

බුද්ධ ධර්මය – II

Name :- .................................................... Grade : -................ Index number:-....................

### II කොටස

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) අගසව්දෙනමගේ පැවිදි කළ නම් වන්නේ කුමක් ද?

i .............................................. ii ..............................................

(ii) උන්වහන්සේලාගේ ගිහිකල නම් කුමක් ද? (ල.02)

i .............................................. ii ..............................................

(iii) මව්වරුන්ගේ දෙදෙනාගේ නම් කුමක් ද? (ල.02)

i .............................................. ii ..............................................

(iv) පැවදි වූ මුල්ම ගුරුවරු කවුද? (ල.02)

i .............................................. ii ..............................................

(v) ඔවුන් අතර පැවති එකඟතාවය කුමක් ද? (ල.02)

i .............................................. ii ..............................................

(vi) ''යේ ධම්මා හේතුප්පභවා '' ගාථා සම්පූර්ණ කරන්න. (ල.02)

..........................................................................................................................

..........................................................................................................................

(vii) මෙම ගාථාව පවසන ලද්දේ කවුරුන් විසින් කුමන් අවස්ථාවේදී ද? (ල.02)

.............................................. ..............................................

(viii) ඉහත ගාථාවේ තේරුම ලියන්න. (ල.02)

..........................................................................................................................

..........................................................................................................................

(ix) සැරියුත් තෙරුණ්ට හා මුගලන් තෙරුණ්ට බුදු සුසුනේ හිමි වූ තනතුරු මොනවා ද?(ල.02)

..........................................................................................................................

..........................................................................................................................

(x) මුගලන් තෙරුණ් වහන්සේ ඍද්ධි බලය යොදා ගනිමින් කල පරමාදර්ශී කාර්යයන් දෙකක් ලියන්න. (ල.02)

..........................................................................................................................

..........................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

2. (i) බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගති පැවතුම් පහක් නම් කරන්න. (ල.05)

(ii) සෝණදණ්ඩ බමුණා පැවසූ බුදුන් වහන්සේ සතු පහත සඳහන් ගුණයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ඒහි සාගත වාදීය
2. සඛිලය
3. සම්මෝදකය (ල.03)

(iii) බුදුරජාණන් වහන්සේ මහජන මතයට ගරු කළ අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

3. (i) දහම් ගුණ හය මොනවා ද? (ල.06)

(ii) ඉහත දැක්වූ දහම් ගුණවලින් දෙකක් පිළිබඳව අර්ථය පැහැදිලි කරන්න. (ල.02)

(iii) බුදුරජාණන් වහන්සේ තමාගේ ඇවෑමෙන් පසුව ශාස්තෘත්වයට පත්වන්නේ කුමක්දැයි ආනන්ද තෙරුණ්ට දන්වා සිටියේ මොනවා ද? (ල.02)

4. (i) සිරිත් විරිත් යනු මොනවා ද? (ල.02)

(ii) අප සමාජයේ දැකිය හැකි චාරිත්‍ර 6ක් නම් කරන්න. (ල.06)

(iii) පැන් වැඩීම සඳහා භාවිතා කරන ගාථා පාඨයේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
''ඉදං මේ ඤාතීනං හෝතු'' (ල.02)

5. (i) බුදුරජාණන් වහන්සේ පිළිබඳ පැහැදී සිටි අන්‍යාගාමිකයන් තිදෙනෙක් නම් කරන්න. (ල.03)

(ii) නෙත සැනසිල්ල බුදු හිමි රුව දැකීම ය
ගත සැනසිල්ල බුදු හිමි රුව වැඳීම ය.......
යන කවිය සම්පූර්ණ කරන්න. (ල.02)

(iii) නව අරහාදී බුදුගුණ මොනවා ද? (ල.03)

(iv) ඉන් එක් බුදු ගුණයක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

6. (i) ''යෝච පුබ්බේ පමජ්ජිත්වා '' ගාථාව සම්පූර්ණ කරන්න. (ල.04)

(ii) එම ගාථාවේ තේරුම ලියන්න. (ල.04)

(iii) එම ගාථාව දේශනා කිරීමට හේතු වූ චරිතය කවුරුන් ද? (ල.02)